**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord.Level) Examination, 2025 (2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය **I, II**
சிங்களமொழியும் இலக்கியமும் **I, II**
Sinhala Language and Literature **I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

උපදෙස්:

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න**. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. **කටින් බතල කොළ සිටුවන්නෝ** ගැමි සමාජයේ මෙන් ම නාගරික සමාජයේ ද විරල නොවෙති.

   (1) කතා කිරීමට රුචියක් දක්වන්නෝ
   (2) බතල වගා කිරීමෙහි උනන්දු වන්නෝ
   (3) සුදුසු පරිදි වගා නොකරන්නෝ
   (4) කතාවට පමණක් සීමා වන්නෝ

2. තම නිර්දේශ ක්‍රියාත්මක නොකළ නිලධාරීන්ට කෝප් කමිටුවේ සභාපතිවරයා **දෙහි කැපුවේ ය.**

   (1) අවවාදාත්මක ව කථා කළේ ය.
   (2) තදබල ලෙස දොස් පැවරුවේ ය.
   (3) දීර්ඝ ලෙස කරුණු දැක්වී ය.
   (4) බොහෝ සේ නිග්‍රහ කළේ ය.

3. ජනතා ප්‍රශ්න හමුවේ **කරබා ගෙන සිටීම** උගත්කමේ ලක්ෂණයක් නොවේ.

   (1) නිහඬ ව සිටීම (2) බියපත් ව සිටීම
   (3) නොසෙල්වී සිටීම (4) ඉවත බලා ගැනීම

- අංක **4** සිට **6** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. මැතිවරණ සඳහා ඉදිරිපත් වන්නෝ තම තමන්ගේ ..................... නංවා ගැනීම පිණිස බොහෝ මුදල් වැය කරති.

   (1) අභිරූප (2) ඡායාරූප (3) ප්‍රතිරූප (4) ස්වරූප

5. ආනන්ද මෛත්‍රෙය මාහිමියෝ වියත් බවින් ද .................... ගුණයෙන් ද යුත් යතිවරයෙකි.

   (1) උවසර (2) හරසර (3) විපිළිසර (4) පැණසර

6. රැකියා ............. තරුණ තරුණියන් නව ව්‍යවසායකයන් බවට පත් කිරීම රජයේ අරමුණ වෙයි.

(1) වියුක්ත (2) නියුක්ත (3) ප්‍රයුක්ත (4) සංයුක්ත

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ප්‍රතිබිම්භය, අල්පේච්ඡ, ඥානාන්විත, කථිකාවත
(2) සංක්ෂිප්ත, දෘෂ්ටිගෝචර, නීත්‍යානුකූල, ප්‍රාසංගික
(3) අවස්ථාවෝචිත, සමස්ථ, සණ්ඨාව, ඓක්‍යය
(4) ව්‍යංගාර්ථ, විකෘති, ස්වාභාවික, අධ්‍යතන

8. පිලි සහිත අකුරු පමණක් **යෙදුණු** වචන සහිත පද පේළිය තෝරන්න.

(1) සූවිසි, ආකෘති, පේරාදෙණි, ගොඩනැගිලි
(2) නිර්මාතෘ, පිහිටුවාලූ, පුස්තිකා, ඇඳුතු
(3) විලාසිනී, කෘතීහු, පුරෝගාමී, කොලීජි
(4) ඉදිකිරීම්, මැලේසියා, ඇතුළු, යුහුසුලු

9. ‘සරිගම’ යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ**,**

(1) ඕෂ්ඨජ, මූර්ධජ,දන්තජ, කණ්ඨජ
(2) මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ, කණ්ඨජ
(3) කණ්ඨජ, ඕෂ්ඨජ, මූර්ධජ, දන්තජ
(4) දන්තජ, මූර්ධජ, කණ්ඨජ, ඕෂ්ඨජ

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) තැන්නෙකුඹුර, බඩල්කුඹුර, බරවාකුඹුර, වලකුඹුර
(2) ආසියාව, රුසියාව, සිරියාව, ඉන්දියාව
(3) කුමාරකන්ද, මොරගහකන්ද, මාලිගාකන්ද, සූරියකන්ද
(4) පූජාවලිය, නාමාවලිය, පද්‍යාවලිය, වර්ණාවලිය

11. ගෞරවාර්ථ අනුක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) මැණියන්, උගතුන්, උත්සාහවන්තයන්, දුවණියන්
(2) ඉදිබුවන්, කුමාරතුංගයන්, කුමාරිකාවන්, සතුරන්
(3) සරච්චන්ද්‍රයන්, නාහිමියන්, මලලසේකරයන්, පුතණුවන්
(4) ගොවියන්, අශ්වයන්, කිවිඳියන්, කතුවරුන්

12. දී ඇති වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත වචනයෙහි විභක්තිය ඇතුළත් වරණය තෝරන්න.
ගම්වැසියන් විසින් **මාර්ගය** ප්‍රතිසංස්කරණය කෙරිණ.

(1) කර්ම විභක්තිය (2) ප්‍රථමා විභක්තිය
(3) කර්තෘ විභක්තිය (4) කරණ විභක්තිය

13. **‘සුගඳ’** යන්න අයත් වනුයේ,

(1) අව්‍යය සමාසයට ය. (2) විභක්ති සමාසයට ය.
(3) විශේෂණ සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

14. විද්‍යාලයීය යන පදය සෑදුණු ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වනුයේ

(1) විද්‍යාල + යීය (2) විද්‍යාල + ඊය
(3) විද්‍යාලයය + ඊය (4) විද්‍යාලය + ඊය

15. **මුලින් දැක්වෙන ව්‍යාකරණ අංගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.**

(1) තද්ධිත නාම - සිඟිති, දේශීය, ගැමි, බලවත්
(2) කෘදන්ත නාම - රකින, වැටුණු, කැපිලි, නැටීම්
(3) සමූහාර්ථ නාම - රංචු, වලස්, පිරිස්, කැල
(4) ගුණ නාම - රතු, දක්ෂ, මහලු, උස

16. කඩිනමින් ගෙමිදුලට ආ දැරිය දුවමින්, නට නටා උඩ පනිමින් සතුට පළ කළා ය.
මෙහි මිශ්‍ර ක්‍රියාවක් **නොවන** වරණය තෝරන්න.

(1) පනිමින් (2) කඩිනමින්
(3) නට නටා (4) දුවමින්

- අංක 17 – 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. සැකකරු කළ **පාපෝච්චාරණය** ඔස්සේ බරපතළ අපරාධ ගණනාවක තොරතුරු හෙළිදරවු විය.

(1) වැරදි පිළිබඳ ප්‍රකාශය (2) පව් ගැන පසුතැවිලි වීම
(3) වැරදි යළි පැවසීම (4) වැරදි නොකරන බවට වූ එකඟතාව

18. අපට වැසිකිළියක් කෙටිකතාවේ **බීභත්සා** රසය දනවන සිදුවීම් හා අවස්ථා ද දක්නා ලැබේ.

(1) හාස්‍ය (2) වීර
(3) පිළිකුල් (4) අද්භූත

19. ‘අපදාන සෝභිනී පඤ්ඤා’ යන ආදර්ශ පාඨයෙහි එන අපදාන යන්නෙහි අර්ථය වන්නේ,

(1) පුද්ගලයා ය (2) කථාව ය
(3) පරිත්‍යාගය ය (4) චරිතය ය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) කිණිහිර, දඬුඅඬුව, මයිනහම, මිටිය
(2) සිලෝ, ගී, සිවුපද, නාට්‍ය
(3) සුළඟ, වැස්ස, අව්ව, පින්න
(4) වර්ෂාමානය, අනිලමානය, උෂ්ණත්වමානය, ආර්ද්‍රතාමානය

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | සොඬු - කම්මුල් | නරමුල් - පැසුණු කෙස් | රොස් - කෝප | විළි - ලජ්ජාව |
| (2) | කුලුණින් - කරුණාවෙන් | සබවස - සත්‍ය වචන | සව් - සියලු | අනූන - අඩු |
| (3) | නෙලුම්- පියුම් | ශක්ති - සවි | ප්‍රගල්භ - දක්ෂ | කුටිල - අවංක |
| (4) | පීය්‍ය - පුටුව | අඩවි - වනය | වක්ත්‍ර - සිරුර | සත්‍ය - සස් |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පොළොව - පෘථිවිය, ධරණි, දෙරණ, මිහි
(2) ගස - රුක, වෘක්ෂය, පාදප, තුර
(3) ස්ත්‍රිය - මාගම, කාන්තාව, ලිය, කත
(4) ආකාශය - අහස,ගගන, ගුවන, නුබමිණ

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) අනිවාර්ය - වෛකල්පික
(2) ස්වාභාවික - කෘත්‍රිම
(3) ආකුල - නිරාකුල
(4) සුවච - දුර්මුඛ

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ඌෂ්මාක්ෂර 'ඝෝෂ' නමින් ද හඳුන්වනු ලැබේ.
(2) 'දසබල' යනු විශේෂණ සමාස නාමයකි.
(3) 'කියග මගිය එනු කොහි සිට' මෙහි 'කියග' යනු විධි ක්‍රියා පදයකි.
(4) 'සෞන්දර්ය' යනු තද්ධිත නාමයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) ලාංකිකයන්ගේ ගෞරවයට ලක් වන සමනොළ ගිරි සිරස සඳහා ය.
(2) අභිමානයෙන් යුතු ව මේ මවුබිම පරම අනාගත දැයට අපගේ රැක දීම යුතුකමකි.
(3) යහපත් දෙමාපියන්ට සැලකීම තම දරුවන්ගේ උත්තරීතර ගුණාංගයකි.
(4) හේ මේ තත්ත්වයන් වටහා ගනිමින් ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැලසුම් කළේ ය.

- අංක **26 – 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ ඇතුළත් වරණය තෝරන්න.

26. කරදරයකින් ඊට වැඩි කරදරයකට පත් වීම

(1) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
(2) වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ
(3) කබලෙන් ළිපට වැටුණා වගේ
(4) ගිරයට අහුවුණු පුවක් ගෙඩිය වගේ

27. ආරක්ෂා කළ යුතු දෙයක් අනාරක්ෂිත තත්ත්වයකට පත් කිරීම

(1) නරියට කුකුල් කොටුව බාර දුන්නා වගේ
(2) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ
(3) උණහපුළුවාට උගේ පැටියා මැණිකක්ලු
(4) අස්සයා පැන ගිය පසු ඉස්තාලෙ වැහුව වගේ

28. ස්වර සන්ධිය හා පූර්වස්වර ලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) වමත, පිළිතුරු
(2) දකුණත, එකිනෙක
(3) සුරත, මැදැහිල්ල
(4) ඔවුනොවුන්, ගමනාගමන

- අංක 29, 30 යටතේ දක්වා ඇති එක් එක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) දෙමාපියෝ දරුවෝ සමග චාරිකාවට එක් වූහ.
(2) මා පාඩම් කරති'යි මිතුරෝ සිතති.
(3) මිනිස්සු අවංක නොවන්නේ ඇයි?
(4) අශෝක රජතුමා දැහැමි පාලකයෙකු ලු.

30. (1) අපේක්ෂකයෝ විභාගයට සූදානම් වී ඇත.
(2) හෙතෙම රෝගීහු සමග පිළිසඳරෙහි යෙදුණේ ය.
(3) අපි යහපත් මිනිසුන් සේ හැසිරෙමු.
(4) දරුවා හෙවත් දැරිය නිතර පොතපත කියවයි.

31. * අම්මා අප ........................ වෙහෙසෙන්නී ය.
* භික්ෂූන් වහන්සේලා ......................... මහා දානයක් පිළියෙල කෙරිණි.
* දැඩි නියඟය ................ වගා බිම් පාළු විය.
* පරිසරය පණ ................. රැක ගනිමු.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) උදෙසා, නිසා, මෙන්, වෙනුවෙන්
(2) වෙනුවෙන්, උදෙසා, නිසා, මෙන්
(3) නිසා, වෙනුවෙන්, උදෙසා, මෙන්
(4) මෙන්, උදෙසා, වෙනුවෙන්, මෙන්

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"අහල පහළ ගෙවල්වල කවුරුවත් එහෙම දෙන සිරිතක් නෑ"

(1) අසල්වැසි නිවෙස්වල කිසිවකු එසේ දීමේ සිරිතක් නොවේ.
(2) අසල්වැසි ගෙවල්වල කිසිවෙක් එසේ දීපු සිරිතක් නැත.
(3) අසල්වැසි ගෙදරවල්වල කිසිවෙකුගේ එවැනි චාරිත්‍රයක් නැත.
(4) අසල්වැසි ගෙවල්වල හැමෝම එසේ දෙන්නේ නැත.

33. වර්තමාන මහනුවර ඇසළ පෙරහැරේ ආරම්භය සිදු වී යැයි සැලකෙන්නේ,

(1) ක්‍රි.ව. 16 වන සියවසේ මැද භාගයේ දී ය.
(2) ක්‍රි.ව. 17 වන සියවසේ මැද භාගයේ දී ය.
(3) ක්‍රි.ව. 18 වන සියවසේ මැද භාගයේ දී ය.
(4) ක්‍රි.ව. 19 වන සියවසේ මැද භාගයේ දී ය.

34. සේනක බිබිලේ මහතා ශ්‍රී ලංකාවට ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් සැලසුම් කරමින් ඊට ගෙන ආ යෝජනාවක් **නොවන්නේ,**

(1) ලංකාවට අනවශ්‍ය බෙහෙත් වර්ග ගෙන්වීම නතර කිරීම
(2) රාජ්‍ය ආයතනවලත් පෞද්ගලික අංශයේත් ඖෂධවලට ඖෂධීය නාමය පමණක් යෙදීම
(3) මෙරට ඖෂධ ගෙන්වීම සහ මෙරට ඖෂධ බෙදා හැරීම සම්පූර්ණයෙන් ම රජයේ ආයතනවලට පැවරීම
(4) ලංකාවේ ඖෂධ නිෂ්පාදනයට පෞද්ගලික අංශයට අවස්ථාව සලසා දීම

35. තල මල පිපිලා නාට්‍යයේ ඇතුළත්,

දේසේ සිට ආ එගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙද රාළගෙ බල්ලා
කාපිලු ගුරුවගෙ කකුල ම අල්ලා

යන කවිය ගායනා කරන්නේ,

(1) රංබරණා (2) සභාපති (3) හේතු (4) ගුණවංශ

36. "කටපුරා පුතේ කියනා හඬ අන්න
දරුවනේඋදේ වෙන කල් නාඬන්න
මට මගේ කඳුළු සීතල විඳගන්න
ඔබ එපා මවුනි ඇහැ පිසදාලන්න"

යන පද්‍ය කොටස ඇතුළත් පද්‍ය නිර්මාණයේ රචකයා වන්නේ,

(1) ගුණදාස අමරසේකර ය.
(2) මහගම සේකර ය.
(3) රත්න ශ්‍රී විජේසිංහ ය.
(4) ඩබ්.ඒ. අබේසිංහ ය.

37. පහත සඳහන් කවියේ සිවු වන පදය තෝරන්න

ඔබ එන තුරා නැත මගෙ හිත සැනසෙන්නේ
මා ගැන නොවෙද හිමි මේ හැටි වෙහෙසෙන්නේ
සවසට යාමටයි ඔබ උදයට එන්නේ
.................................................................................

(1) ආවිට වෙහෙස නිවුමට නින්දට යන්නේ
(2) මෙහෙමද ජීවිතේ දිගටම ගත වෙන්නේ
(3) මුළු රෑ විඳින දුක ඔබ පමණයි දන්නේ
(4) දිවි මග නිමන තුරු මේලෙස ගත වන්නේ

38. කමත් භාෂා ව්‍යවහාරයේ දී 'කූටාලම' යනු,

(1) කුඩාරමකි. (2) කුඩා හට්ටියකි.
(3) කණ්ඩායමකි. (4) මැනුම් උපකරණයකි.

39. උදුල සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැල

යන පද්‍යයෙන් කියැවෙන්නේ කියැවෙන්නේ කුමක් ගැනද?

(1) අලංකාර තරු සමූහය (2) විසිරුණු මල් සමූහය
(3) සඳරැස් සමූහය (4) විචිත්‍රවත් පරිසරය

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"උන් වහන්සේගේ භාෂාන්තර ඥානය ධර්ම දූත සේවයෙහි යෙදුණු ආකාරයෙන් ද නිර්මිත ශාස්ත්‍රීය ග්‍රන්ථ සමූහයෙන් ද සාධනය වේ."

(1) උන්වහන්සේගේ විවිධ භාෂා පිළිබඳ දැනුම සාධනය වන්නේ ධර්ම දූත සේවයෙහි යෙදුණු ආකාරයෙනි.

(2) උන්වහන්සේ සතු විවිධ භාෂා පිළිබඳ දැනුම ධර්ම දූත සේවයෙහි යෙදුණු ආකාරය සහ නිර්මාණය කළ ශාස්ත්‍රීය කෘති සමූහයෙන් ද පළ වේ.

(3) නිර්මාණය කළ ශාස්ත්‍රීය ග්‍රන්ථ සමූහයෙන් සාධනය වන්නේ උන්වහන්සේගේ භාෂාන්තර ඥානය හා ධර්ම දූත සේවයෙහි යෙදුණු ආකාරය යි.

(4) උන්වහන්සේගේ භාෂාන්තර ඥානය නිසා ධර්මදූත සේවය ද ශාස්ත්‍රීය ග්‍රන්ථ සමූහයක් ද සාධනය කර ගත්තේ ය.

***

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord.Level) Examination, 2025 (2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature, I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

- ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්,** එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්
(අ) අඝෝෂ මහාප්‍රාණ අක්ෂරයක් ලියා දක්වන්න.
(ආ) ඝෝෂ මහාප්‍රාණ අක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
"ලේඛම්තුමා පරිගණක ලේඛණ විමසා බලා කාර්ය මණ්ඩලයට දීර්ඝ ලෙස උපදෙස් දුන්නේ ය."

(iii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) කනිටු (ආ) අධම

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පද ලියන්න.
(අ) වනයෙහි හැසිරෙන (ආ) පාවහන් අලුත්වැඩියා කරන්නා

(v) පහත සඳහන් පද සන්ධි කොට ලියා, සන්ධි වර්ගය නම් කරන්න
(අ) කිරිමැටි + ආන (ආ) වල් + ඌරා

(vi) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) පියවරුන් මවුවරුන් හා විදේශගත වූහ.
(ආ) සියලු මිනිස්සු සත්‍ය ගරුක විය යුතු ය.

(vii) පහත සඳහන් උක්ත පදවල අනුක්ත රූප ලියා දක්වන්න.
(අ) හෙතෙම (ආ) ස්ත්‍රීහු තුමූ

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) මිතුරෝ මා ඉගෙනුම් කටයුතුවලට යොමු කළහ.
(ආ) ගුරුවරියක් මවක මෙන් සිසුවිය රැක බලා ගත්තා ය.

(ix) පහත සඳහන් යෙදුම්වල **තද කළු අකුරින්** මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.
(අ) උයනෙහි නන් පැහැ කුසුම් **පිපී** සුළඟින් සැලෙයි.
(ආ) කුරුලු අහින මිහිරි සර **දිදී** පරිසරය ගීතවත් කරති.

(x) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන විභක්තිය නම් කරන්න.
(අ) අනේ! **දේවයන් වහන්ස,** ක්ෂමා කළ මැනව.
(ආ) ප්‍රවීණ **ලේඛකයන්ගේ** කෘතිවල ගැඹුරු ජීවන දර්ශනයක් ද ප්‍රකට වේ.

(ලකුණු 02 ×10=20යි)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යෙදෙන්න.

(ආ) මත් උවදුර දිනෙන් දින ව්‍යාප්ත වීම සමාජ ව්‍යසනයකි. මෙය මර්දනය කිරීම කාලීන අවශ්‍යතාවකි. මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදු වන හානිය සුළු පටු නොවේ. වසංගතයක් ලෙස පැතිරී යන මත් උවදුරට වැට බැඳීමෙන් නොයෙක් දුරාචාර හා අපරාධ වැළකී සමාජ අභිවෘද්ධියට මඟ සැලසේ.

(ආ) රියැදුරන්ගේ හා මගීන්ගේ නොසැලකිලිමත්කමින් දිනපතා සිදු වන මාරක රිය අනතුරු නිසා වටිනා ජීවිත මෙන් ම දේපළ ද විනාශ වෙයි. එම ව්‍යසනය වැළැක්වීමේ ලා රජය, ජනමාධ්‍ය හා සමාජ සංවිධාන වෙත විශාල කාර්යභාරයක් පැවරී ඇත. ඒ සඳහා පොදු ජනතාවට ද ඇත්තේ සුවිසල් වගකීමකි.

(ඉ) අපමණ වෙහෙසක් දරා වගාවෙහි නිරත වන ගොවීන්ට තම අස්වනු අලෙවි කර ගැනීමේ දී දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදු වේ. ගොවීන් ද පාරිභෝගික ජනයා ද තෘප්තියට පත් වන වැඩපිළිවෙළක අවශ්‍යතාව මතු ව තිබේ. ඒ සඳහා වගකිව යුත්තන්ගේ අවධානය යොමු කිරීම වටී.

(ඊ) ජංගම දුරකථන භාවිතය නිසා පාසල් සිසුන් කියවීමෙන් ඈත් වී ඇති බවට මතයක් පළ වේ. එවන් තත්ත්වයක් අධ්‍යාපනික සමාජයකට උචිත නොවේ. මීට බලපාන හේතු හඳුනා ගෙන සිසු පරපුර පොතපත කියැවීම සඳහා යොමු කිරීම උදෙසා ගත යුතු පියවර පිළිබඳ සමාජ කතිකාවතක් අවශ්‍ය වේ.

(ලකුණු 25යි)

3. පහත දැක්වෙන පාඨය වචන 60 -70 අතර වන සේ සාරාංශ කොට ලියන්න.

ශ්‍රී ලංකාවේ පැරණි ගෘහ නිර්මාණ ශිල්පයේ මෙතෙක් අවධානය යොමු නොවූ විශේෂ ලක්ෂණයක් වූයේ උද්‍යාන නිර්මාණ කලාවයි. මෙම කලාවේ කැපී පෙනෙන උපාංගයක් වූයේ ශිලා උද්‍යාන නිර්මාණය කිරීමයි.

අද සීගිරිය නරඹන්නා මහා පර්වතයෙන් හා සිතුවම්වලින් කොතරම් වසඟයට පත්වේ ද කිවහොත් ඒ කරා යන ගමනේ දී පස්වන සියවසේ සංස්කෘතිය පිළිබඳ ජීවමාන කෞතුකාගාරයක් බඳු වූ මේ උද්‍යානයන්ට ඔහුගෙන් ලැබෙන්නේ නෙතග බැල්මක් පමණි. එහෙත් සැබැවින් ම සෞන්දර්යාත්මක හා ඓතිහාසිකව වැදගත් වන්නේ මේ උද්‍යානයන් ම ය. ඒවා මුළු ආසියාවෙන් ම දැනට ඉතිරි වී ඇති පැරණිතම දර්ශනීය උද්‍යාන වන අතර මුළු මහත් ලොව ම ගත් කල ඒවා දෙවැනි වන්නේ යුරෝපයේ පැරණි රෝම උයන් වතුවලට පමණකි. අතීතයේ එක් යුගයක මෙය තුරු පෙළින්, මල් ගොමුවලින් හා පස් පියුමින් සැදි රාජකීය ජීවිතයේ කාන්තියෙන් හා කෙළි දෙළෙන් ජීවමාන වූ නන්දනෝද්‍යානයක් විය.

ජල උද්‍යාන ඔස්සේ පර්වතය වෙත ගමන් ගන්නා අප පිවිසෙන්නේ සුවිසල් දිය අගල් දෙකකින් වට වූ දූපත් දෙකක් මත පිහිටි ගිම්හාන මාලිගා දෙකක් දෙපසින් ඇති පටු අංගණයකට ය. මේ අංගණය පුරා පැතිරී ඇති ගඩොලින් තැනුණු නොගැඹුරු කෘත්‍රිම දිය පාරවල් වඩාත් චමත්කාර ජනක වන්නේ තැනින් තැන හිරිගලින් තැනූ දියමල් නිසා ය. මැත දී කරන ලද කැණීම්වලින් පස් හා කුණු රොඩු ඉවත් කොට ඇති බැවින්, වැසි ජලය මැනවින් ඇති දිනක ප්‍රමාණවත් පීඩනයක් ලබන මේ දියමල් අද වුවත් පණ ගැන්වෙමින් විසිතුරු වන හැටි අපූරු ය. වෙනත් තැන්වලින් මහා පරිමාණ වාරිමාර්ග කටයුතු සඳහා උපයෝගී කරගත් සිංහලයන්ගේ ජල වේග පාලන තාක්ෂණ ඥානය මෙතැන යෙදුණේ විනෝදකාමී සොඳුරු ලොවක සිරිය නැංවීමට ය. මෙම සංකීර්ණ ජලෝද්‍යානයෙහි කුඩා ජලපාලන බිසෝ කොටු හා යන්ත්‍රක්‍රම යොදා ගත්තේ පියගැට පෙළ හා පෙත්මං ඔස්සේ විහිදෙන ගඩොලින් බැඳි දිය බස්නා උමං ජලමාර්ග උපයෝගී කරගෙන ය.

(ලකුණු 10යි)

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

උඩරට රාජ්‍ය තන්ත්‍රයේ අසීමිත හා අසහාය බලතල රජු සතුව පැවතුණු බව පෙනේ. න්‍යායාත්මක වශයෙන් රාජ්‍යයේ අසහාය නායකයා වූ ඔහුට නීති පැනවීම, යුද්ධය හා සාමය පිළිබඳ තීරණ ගැනීම, රටේ ඉහළ ම අධිකරණය වශයෙන් රට වැසියාගේ ජීවිතය හා මරණය පිළිබඳ තීරණ ගැනීම, ආදිය තම මනාපය මත කළ හැකි විය. මෙබඳු බලතල ඔහු සතුව තිබුණ ද ඒවා ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් සීමා තුළ කටයුතු කිරීමට ඔහු බැඳී සිටියේ ය. කාලයක් තිස්සේ රාජ්‍ය තුළ ක්‍රියාත්මක වූ චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායට ගරු කිරීමට සිදු වීම එබඳු එක් සීමාවකි. රජකු විසින් කෙසේ කටයුතු කළ යුතු ද යන්න පිළිබඳ ආගමානුකූල සම්ප්‍රදායන් අනුගමනය කරන්නට සිදු වීම තවත් එකකි. අමාත්‍ය මණ්ඩලයේ සහ මහානායක හිමිවරුන්ගේ උපදෙස් පිළිගැනීමට සිදු වීමෙන් ද රජුගේ බලය සීමා විය. යම් රජකු රටේ සම්මත නීතිරීති නො සලකා අසාධාරණ ලෙස කටයුතු කරයි නම් රටවැසියන් තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත් එක් උපක්‍රමයක් වූයේ රජුට විරුද්ධව කැරලි ගැසීම ය. රජු හා රජවාසල සේවාවලට සම්බන්ධ වූ නිලධාරී පන්තියක් විය. රජවාසල හා සම්බන්ධ කාර්යාංශ ගණනාවක් විය. ආරක්ෂක කටයුතු, භාණ්ඩාගාරික කටයුතු, යුද කටයුතු හා පොදු කටයුතු භාර නිලධාරීහු ද රාජකීය ගබඩාව සහ රජවාසල අවශ්‍ය සේවා සපයන නිලධාරීහු ද රජුගේ පෞද්ගලික සුඛ විහරණය භාර නිලධාරීහු ද මොවුන් අතර වූහ. මෙහිදී කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ කුලය පදනම් කරගත් විවිධ සේවාවන් සැපයූ අය බද්ද හෙවත් පේරුව නැමැති කාර්යාංශ යටතේ සංවිධානය කොට තිබීම යි.

i. උඩරට රාජ්‍යයේ රජු සතු වූ බලතල දෙකක් සඳහන් කරන්න.
ii. රජුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී බලපෑ සීමා අතුරෙන් දෙකක් නම් කරන්න.
iii. රජතුමාට විරුද්ධව කැරලි ගැසීමට රටවැසියන් පෙලඹෙන්නේ කුමක් නිසා ද?
iv. රජවාසල හා සම්බන්ධ නිලධාරීන්ට පැවරුණු සේවා සැපයූ පිරිස් දෙකක් දක්වන්න.
v. අසහාය, සුඛ විහරණය යන වචන දෙකෙහි අරුත් ලියන්න.

(ලකුණු 2 × 5 = 10යි)

5. කලක සිට අබලන් ව පැවති කි.මී. 5ක් පමණ වූ හපුගස්විට දැලංකඩ මාර්ගය ප්‍රාදේශීය සභාව විසින් පසුගිය දා ප්‍රතිසංස්කරණය කෙරිණ. මාර්ගය අබලන් වීමට පෙර ධාවනය වූ බස් රථය මේ වන විට ධාවනය නොවේ. බස් රථය ධාවනය නොවීම හේතුවෙන් පාසල් සිසුන්ට මෙන් ම රැකියා හා එදිනෙදා කටයුතු සඳහා යන වැඩිහිටියන්ට ද සිදු වී ඇති දුෂ්කරතා සඳහන් කරමින් යළි එම බස් රථය ධාවනයට යොදවන ලෙස ඉල්ලා තුඩුමුල්ල ඩිපෝ අධිකාරිවරයා වෙත යැවෙන ලිපිය සකස් කරන්න. (ලිපිය යවන ඔබ දැලංකඩ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් සුභාෂ් චන්ද්‍රනාත් යැයි සිතන්න)

නැතහොත්

නියගල ජයම්පති මහා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය පසුගිය දා නිමාවට පත් විය. මේ පිළිබඳ පහත තොරතුරු ඇතුළත් කරමින් පුවත් පත් වාර්තාවක් සකස් කරන්න.

- පැවැත්වූ දිනය හා වේලාව
- ප්‍රධාන අමුත්තා
- ත්‍යාග හා සහතික පත්‍රලාභීහු
- උත්සවයේ විශේෂාංග
- සංවිධානය හා අනුග්‍රහය

පුවත්පත් වාර්තාව ලියන ඔබ සිතුමිණි අබේකෝන් යැයි සිතන්න.

(ලකුණු 15යි)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord.Level) Examination, 2025 (2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5,6,7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
  මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "එලෙස කියා තමන් රහත් නියාවක් හඟවති."

**(අ)** මෙහි තමන් යනු කවරෙක් ද?
**(ආ)** මෙම ප්‍රකාශය උපුටා ගත් කථාව ඇතුළත් කෘතිය කුමක් ද?

(ii) මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
.........................................................................
කෙකටිය ඕලු නළියන දිය රැළි මැද්දෙන්
මල්පෙති වියළි කොළ එන අතකට එද්දෙන්

**(අ)** මෙහි දෙවන පාදය සම්පූර්ණ කරන්න.
**(ආ)** මෙම පද්‍ය පන්තියේ රචකයා ලියූ ඉතා ජනප්‍රිය වූ කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

(iii) "මට එහෙම එකක් ගැන කල්පනාවක් වුණේ ම නැනෙ"

**(අ)** මෙසේ කියන ලද්දේ කවුරුන් විසින් ද?
**(ආ)** මෙම ප්‍රකාශය ඇතුළත් කතාවේ මුල් රචකයා නම් කරන්න.

(iv) තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය සිරිසඳ ගෙන වැලැන්දේ

**(අ)** මෙහි 'පිළිමල්' යනුවෙන් අදහස් වන්නේ කවරෙක් ද?
**(ආ)** 'විජය සිරිසඳ' යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය ලියන්න.

(v) "දේවයෙනි, මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම් හ."

**(අ)** මෙහි ඇතුළත් අපි යනු කවුරහු ද?
**(ආ)** මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ අදාළ පාඩමේ කුමන අනුකොටසේ ද?

(vi) **(අ)** එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත සිංහල සාහිත්‍ය විචාර ග්‍රන්ථයක් නම් කරන්න.
**(ආ)** සිංහල සාහිත්‍යයේ විශිෂ්ටතම පද්‍ය කාව්‍ය කෘතිය ලෙස සැලකෙන්නේ කුමක් ද?

(vii) "අප නො හඳහා නම් තෙපි මැ පිරික්සා බලව" යි කීහැ.

**(අ)** මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

**(ආ)** මෙම උපුටනය ඇතුළත් කෘතිය ලියැවුණු යුගය නම් කරන්න.

(viii) “රාළහාමි ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද?”

**(අ)** මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?
**(ආ)** මෙහි සඳහන් දන්නවා දැයි විමසූ ආරංචිය කුමක් ද?

(ix) **(අ)** සැළලිහිණි සන්දේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?
**(ආ)** ප්‍රථම සන්දේශ කාව්‍යය රචනා කළ අයගේ නම ලියන්න.

(x) **(අ)** ‘අපට වැසිකිළියක්’ කෘතියේ කතුවරයා ලියූ මුල් ම කෙටිකතා සංග්‍රහය නම් කරන්න.
**(ආ)** මහගම සේකරයන් මිය යෑමෙන් අනතුරුව ප්‍රකාශයට පත් වූ ඔහුගේ කෘතියක නමක් ලියන්න

(ලකුණු 02×10=20යි)

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න

(i)

කුළින් කුළම **සිහිල’ඹ** වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරුය
තළින් තළම පුල් පියුමු’පුල **පඬෙරුය**

**(අ)** මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

**(ආ)** මෙහි ඇතුළත් ශබ්දාලංකාරයක් නම් කොට උදාහරණයක් ලියන්න.

(ii) “ මහ තෙරුන් හිඳ **සස්** කළ තන්හි පිළක් කළහ. **මූඪගර්භ** වූ තිරිසන්ගතියැ සත්හු දු ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්. යමක් දුර්බල ද, ගෙනැ එන්නට නො හැකි ද, ඇයට පිළ දෙව් දිය ඇරැ හිසැ ඔත් කලැ එ කෙණෙහි ම බර මුසී. සෙසු රොග ද සන්හිඳි.”

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න

**(ආ)** ඉහත ඡේදයේ අර්ථය සරල බසින් ලියන්න.

(iii)

ගසට කෙටුම ගස මුල **පෑයුමෙන්** දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
**අමුතු බත් දීම** අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬහැරෙන් දැනේ

**(අ)** ඉහත තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
**(ආ)** කවියේ දැක්වෙන පරිදි කාර්යයෙහි සාර්ථකත්වයට හේතු වන කරුණු දෙකක් දක්වන්න.

(iv) “මහා බෝධිසත්ත්වයන්ගේ දිගන්තරයේ පතළා වූ තේජස් පරිද්දෙන් පහරන්නා වූ හිරු රැසින් ඩා වැහෙන්නා වූ ශරීර ඇති වූහ. මහ බෝසතාණන් වහන්සේ ද, ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීර්‍ය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත වැ **අසම්භීත වැ** වාසල් දොර හරවා, නුවරින් නික්ම, රථයෙන් බැස, කෙසරු සලා විදහා කිලිපොලන්නා වූ සිංහ රාජයෙකු සේ **විජෘම්භනය** කෙරෙමින්...’

**(අ)** මෙහි හිරු රැස් සමාන කොට ඇත්තේ කුමකට ද?
**(ආ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(v) සෙනේහය පිරී ගිය ඔබෙ නයන නිල් පොකුණ
**දිය නිලන** වැසි සමේ රැලි නගා උතුරා ය
**තඹර** පෙති අතර හෙල්මැලි රේණු වැසි වසින
ඔබ සිනාවෙන් නිවේ හුණුව ගිය ලේ නහර

**(අ)** මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
**(ආ)** "ඔබෙ සිනාවෙන්" යන්නෙන් අර්ථවත් වන්නේ කුමක් ද?

(ලකුණු 04×05=20යි)

**3.** උම්මග්ග ජාතකයේ,

- මහෞෂධ පඬිතුමාගේ චරිතය උදාරබවින් යුක්තවත්
- කේවට්ට චරිතය අවඥාසහගත ලෙසත්

නිරූපණය වන අන්දම 'සතරකන් මන්ත්‍රණය' පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

සැළලිහිණි සන්දේශ කතුවරයා

- අර්ථාලංකාර හා
- ශබ්දාලංකාර

යොදා ගනිමින් අපූර්ව වස්තු නිර්මාණයෙහි ලා දක්වන සමත්කම කෙබඳු දැයි එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15යි)

**4.**

- ජාතිකාභිමානි හැඟීම් ජනිත කිරීමටත්
- චරිත සංවර්ධනයට අවශ්‍ය මග පෙන්වීමටත්

ගන්නා උත්සාහය මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

ගීතවත් බස් වහරක් යොදා ගනිමින්

- සිංහයාගේ හා
- සිංහබාහුගේ
  සිතුම් පැතුම්

අපූරු අන්දමින් නිරූපණය කිරීමට නිර්මාණකරුවා උත්සාහ දරා ඇත. අදාළ පාඩම ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් මෙම අදහස තහවුරු කරන්න.

(ලකුණු 15යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** කුරක්කන් වගාවේ ආරම්භයේ සිට අවසානය දක්වා වූ සමස්ත ක්‍රියාවලිය ම 'කුරහන් ඉසිමුව කළුවර බලාලා' පාඩමෙන් ඉදිරිපත් කෙරේ. උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

**6.** ශ්‍රමය පිළිබඳ ඉමහත් ගෞරවයක් ඉස්මතු වන අයුරින් කවියා 'දෑතේ කරගැට සිඹ සනසන්නට' පද්‍ය පන්තිය නිර්මාණය කර ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් මෙම කරුණ තහවුරු කරන්න.

(ලකුණු 10යි)

**7.** බිරිඳගේ ක්‍රියාකාරකම් හමුවේ උරණ නොවී ඉවසීමෙන් කටයුතු කරන ස්වාමි පුරුෂයකු ලොයිසල් මහතාගේ චරිතයෙන් නිරූපණය කෙරේ. 'දියමන්ති මාලය' පාඩම ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් මේ පිළිබඳ විමසීමක යෙදෙන්න.

(ලකුණු 10යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)

සිංහල භාෂාව හා සාහිත්‍යය

I පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | **4** | 11. | **3** | 21. | **1** | 31. | **2** |
| 02. | **2** | 12. | **2** | 22. | **4** | 32. | **1** |
| 03. | **1** | 13. | **1** | 23. | **4** | 33. | **3** |
| 04. | **3** | 14. | **4** | 24. | **2** | 34. | **4** |
| 05. | **4** | 15. | **3** | 25. | **4** | 35. | **1** |
| 06. | **1** | 16. | **2** | 26. | **3** | 36. | **3** |
| 07. | **2** | 17. | **1** | 27. | **1** | 37. | **2** |
| 08. | **3** | 18. | **3** | 28. | **4** | 38. | **4** |
| 09. | **4** | 19. | **4** | 29. | **2** | 39. | **1** |
| 10. | **1** | 20. | **2** | 30. | **3** | 40. | **2** |

සිංහල භාෂාව හා සාහිත්‍යය
II පත්‍රය - පිළිතුරු

01.

(i) (අ) බ, ජ, ය, ඵ, ළ
(ආ) ස, ඝ, ඪ, ඩ, හ

(ii) (අ) ලේකම් (ආ) ලේඛන

(iii) (අ) දෙටු (ආ) උත්තම

(iv) (අ) වනචාරි (ආ) සපතේරුවා

(v) (අ) කිරිමැටියාන - ආගම සන්ධිය
(ආ) වල්ලූරා - ද්විත්ව රූප සන්ධිය

(vi) (අ) පියවරු මවුවරුන් හා විදේශගත වූහ.
(ආ) සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.

(vii) (අ) ඔහු (ආ) ස්ත්‍රීන්

(viii) (අ) මිතුරන් විසින් මම ඉගෙනුම් කටයුතුවලට යොමු කරන ලදිමි/ ලද්දෙමි/ ලැබුවෙමි/ ලැබීමි.
(ආ) ගුරුවරියක විසින් මවක මෙන් සිසුවිය රැක බලා ගන්නා ලද්දී ය/ ගනු ලැබුවා ය.

(ix) (අ) පූර්ව ක්‍රියා
(ආ) මිශ්‍ර ක්‍රියා

(x) (අ) ආලපන විභක්තිය
(ආ) සම්බන්ධ විභක්තිය

(ලකුණු 02 ×10 =20)

02. ● ආදර්ශ මාතෘකා හා අන්තර්ගතය සකස් විය යුතු අන්දමට සංක්ෂිප්ත මග පෙන්වීමක්

(අ) මත් උවදුරින් දුරුවෙමු.

- මත් උවදුර හඳුනාගැනීම
- මත් උවදුරට ගොදුරු වීමේ හේතු
- මත් උවදුරින් දුරුවීමට විසඳුම්
- ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

(ආ) මහමග අනතුරු - වළකමු නිරතුරු

- මහ මග අනතුරු යනු?
- මහාමාර්ග අනතුරුවලට හේතු
- මහාමාර්ග අනතුරුවලට විසඳුම්
- ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

(ඉ) වගාව හා අස්වැන්න ආශ්‍රිත ගොවි ගැටලු.

- වගා කටයුතු හා ඒ සඳහා ගන්නා වෙහෙස
- අස්වනු අලෙවි කර ගත නොහැකි වීම
- ගොවි හා පාරිභෝගික ජනයා මුහුණ දෙන ගැටලු
- ඒ සඳහා යෝජිත විසඳුම් හා ක්‍රියාමාර්ග

(ඊ) කියවීමට බාධා පමුණුවන ජංගම දුරකථනය

- ජංගම දුරකථනය අවභාවිතය
- කියවීමට එය බාධක වන අයුරු
- කියවීම ප්‍රවර්ධනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත් භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු ය.

**සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08**

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස් වීම, සමබවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩු වීම | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩු වීම | ලකුණු 4ට අඩු |

**සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12**

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් දක්නට ලැබීම | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම, නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම, භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම | 6- 4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම නිර්මාණාත්මක භාවය දක්නට නොලැබීම, නිරවුල් නොමැති වීම, භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම | 3-1 |

**ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.**

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම, පැහැදිලි අත් අකුරු භාවිත කිරීම, විරාම ලක්ෂණ නිවැරදිව භාවිත කිරීම, නිවැරදි ඡේද වෙන් කිරීම, අක්ෂර වින්‍යාස රීති භාවිතය | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත් අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම | 1 |

03. සාරාංශකරණය

අන්තර්ගතය

- පැරණි ගෘහ නිර්මාණ කලාවේ පිළිබිඹුවක් වන ශිලා උද්‍යාන නිර්මාණය සඳහා යොමු වී ඇත්තේ අල්ප අවධානයකි.
- සීගිරි පව්ව හා එහි සිතුවම් නරඹන්නෝ සීගිරි උද්‍යාන ගැන සැලකිලිමත් නොවෙති.
- මෙම උද්‍යාන රෝම උයන් වතුවලට පමණක් දෙවැනි වන පැරණිතම අලංකාර උද්‍යානයෝ ය.
- සීගිරියේ ගිම්හාන මාලිගා දෙක දෙපස නොගැඹුරු කෘත්‍රිම දිය පහරවල් හිරිගලින් තැනූ දියමලින් චමත්කාර වී ඇත.
- කැණීම්වලින් සොයාගෙන ශුද්ධ කරන ලද මෙම දියමල් පීඩනයක් සහිතව වැඩි ජලයෙන් විසිතුරු ලෙස පණ ගැන්වෙයි.
- මෙමගින් සිංහලයන්ගේ විනෝදකාමී සොඳුරු ලොවක සිරිය මවා ලන සේ යොදා ගත් ජල තාක්ෂණයේ අපූර්වත්වය විදහා දැක්වෙයි.

ලකුණු විග්‍රහය :

1. අන්තර්ගතය - ලකුණු 06 යි
2. වචන ගණන - ලකුණු 02 යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි

**සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06**

| | |
|---|---|
| ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කර තිබීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම. | ලකුණු 05 - 06 |
| ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම, වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල් බව රැක ගැනීම. | ලකුණු 03 - 04 |
| ප්‍රධාන කරුණු ස්වල්පයක්වත් ඉදිරිපත් කර තිබීම ල වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01 - 02 |

04.

i.
- නීති පැනවීම
- යුද්ධය හා සාමය පිළිබඳ තීරණ ගැනීම
- රටේ ඉහළම අධිකරණය වශයෙන් රට වැසියන් ජීවිතය හා මරණය පිළිබඳ තීරණ ගැනීම.

(මෙයින් කරුණු දෙකක් සෑහේ)

ii. • චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායට ගරු කිරීම සිදු වීම
   • ආගමානුකූල සම්ප්‍රදායන් අනුගමනය කරන්නට සිදු වීම
   • අමාත්‍යවරුන්ගේ හා මහානායක හිමිවරුන්ගේ උපදෙස් පිළිගැනීමට සිදු වීම
   (මෙයින් කරුණු දෙකක් සෑහේ)

iii. රටේ සම්මත නීතිරීති නොසලකා කටයුතු කිරීම නිසා

iv. • ආරක්ෂක කටයුතු
   • යුද කටයුතු
   • පොදු කටයුතු
   • රජ වාසල සේවා කටයුතු
   • රජුගේ පෞද්ගලික සුඛ විහරණ කටයුතු
   (මෙයින් කරුණු දෙකක් ලිවීම සෑහේ)

v. අසාහය - ප්‍රබල/ අසමාන/ සමාන නොවූ
   සුඛ විහරණය - සැප සේ ගත කිරීම/ සුව සේ ජීවත් වීම

(ලකුණු 02 ×10 =20)

**05. රාජකාරී ලිපිය**

**ලකුණු** විග්‍රහය **මුළු ලකුණු - 15 යි**

1. ආකෘතිය - ලකුණු 04 යි
2. අන්තර්ගතය - ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

1. ආකෘතිය - ලකුණු 04යි

- යවන්නාගේ ලිපිනය - ලකුණු 04 යි
- ලබන්නාගේ නම හා ලිපිනය - ලකුණු 01 යි
- මාතෘකාව - ලකුණු 01 යි
- අත්සන හා දිනය - ලකුණු 01 යි

2. අන්තර්ගතය - ලකුණු 08 යි

1. මාර්ගය අබලන් ව තිබූ බව - ලකුණු 01 යි
2. මාර්ගය ප්‍රතිසංස්කරණය කළ බව - ලකුණු 01 යි
3. පෙර පැවති බස් රථය ධාවනය නොවන බව - ලකුණු 01 යි
4. බස් රථය ධාවනය වීමේ ප්‍රයෝජන - ලකුණු 02 යි
5. බස් රථය ධාවනය නොවීමේ දුෂ්කරතා - ලකුණු 02 යි
6. බස් රථය නැවත ලබා දෙන ලෙස ඉල්ලීම - ලකුණු 01 යි

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

**පුවත්පත් වාර්තාව**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි

1. ආකෘතිය - ලකුණු 04යි
2. අන්තර්ගතය - ලකුණු 08යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

1. ආකෘතිය - ලකුණු 04 යි
   2. මාතෘකාව - ලකුණු 01 යි
   3. වාර්තාකරු - ලකුණු 01 යි
   4. යෝග්‍ය ලෙස සිද්ධි ගැළපීම - ලකුණු 02 යි

2. අන්තර්ගතය - ලකුණු 08යි (පහත කරුණු සඳහා ලකුණු 01 බැගින් පිරිනමන්න)

1. පැවැත් වූ දිනය
2. පැවැත් වූ වේලාව
3. මුඛ්‍ය අරමුණ
4. ප්‍රධාන අමුත්තා
5. ත්‍යාග හා සහතිකලාභීහු
6. උත්සව විශේෂාංග
7. සංවිධානය
8. අනුග්‍රහය

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, ඡේද වෙන් කිරීම

සිංහල භාෂාව හා සාහිත්‍යය

III පත්‍රය - පිළිතුරු

1.

(i) (අ) උග්ගසේන තෙරුන්

(ආ) සද්ධර්මරත්නාවලිය

(ii) (අ) ළය යට සසල බව මින් මතු නොනැහෙද්දෙන්

(ආ) ඈ

(iii) (අ) මැටිල්ඩා

(ආ) ගී ද මෝපසාං

(iv) (අ) මූසිල

(ආ) රූපක/ රූපකාලංකාර

(v) (අ) සේනකාදි පණ්ඩිතවරු සතර දෙනා

(ආ) මියුලු නුවර වටලෑම

(vi) (අ) කල්පනා ලෝකය/ සාහිත්‍ය විද්‍යාව

(ආ) කව් සිළුමිණ

(vii) (අ) තුන් රුසට ම අයත් වූ ශිෂ්‍ය පිරිස

(ආ) පොළොන්නරු

(viii) (අ) පුංචිරාළ වෙදරාළ

(ආ) බබුන් ජීවත් සිටී ද නැති ද යන්න පිළිබඳ ආරංචිය

(ix) (අ) උලකුඩය දේවියට පුත් කුමරෙකු ලබා දෙන ලෙස ඉල්ලමින් කැලණියේ විභීෂණ දෙවියන්ට කරන ආයාචනය

(ආ) මහාකවි කාලිදාස

(x) (අ) පුනරුත්පත්තිය සහ තවත් කෙටිකතා

(ආ) ප්‍රබුද්ධ/ සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ

(ලකුණු 02×10=20 යි)

2. (i) (අ) සීතල ජලය/ සුදු නෙලුම්

(ආ) අනුප්‍රාසය - කුළින් කුළම/ දොළින් දොළම/ කල් යල් / තල් පොල්/ පළින් පළම/ තළින් තළම

එළිසමය - කඳුරු ය/ කුඹුරු ය/ මැඳුරු ය/පඬෙරු ය

විරිත - මාත්‍රා 18 කින් සමන්විත/ සමුද්‍රඝෝෂ විරිත

(ii) (අ) සත්‍ය ක්‍රියා / ගැබ් මුළා වූ, කුසෙහි හරස් ව පිහිටි දරු ගැබක් සහිත

(ආ) අඟුල්මල් මහ තෙරුන් අසුන් ගෙන සත්‍ය ක්‍රියා කළ ස්ථානයේ වේදිකාවක් සෑදූහ. කුසෙහි හරස් ව සිටින දරු ගැබක් සහිත තිරිසන් සතුන් පවා ගෙනවුත් එම වේදිකාවේ නිදි කරවති. එවිට ම නිරෝගී ව දරුවා මවු කුසින් බිහිවේ. යම්කිසි කෙනෙක් ශක්තිය පිරිහී වේදිකාව දක්වා ගෙන ඒමට නොහැකි වූ අවස්ථාවේ දී ඇයට වේදිකාව සෝදා එම ජලය රැගෙන ගොස් හිසෙහි ගැල්වූ විට ඒ මොහොතේ ම දරු ගර්භයේ බරින් මිදුණා ය. පැවතියා වූ වෙනත් රෝග තත්ත්වයන් ද සුවපත් වී.

(iii) (අ) එළි පෙහෙළි කිරීමෙන්/ ශුද්ධ කිරීමෙන්
ආගන්තුක සත්කාරය

(ආ) ගසක් කැපීමට පෙර ගසේ මුල් ප්‍රදේශය ශුද්ධ කර ගැනීම
සී සෑමක දී ගොවියා නඟන අඬහැරය අනුව එහි ස්වභාවය පෙන්නුම් කිරීම.

(iv) (අ) මහා බෝධිසත්ත්වයන්ගේ දිගන්තරයේ පතළා වූ තේජස්

(ආ) එඩිතරව/ නොබියව
වැජඹෙන/ විරාජමාන

(v) (අ) නිල් පැහැයෙන් යුතු දිය/ ජලය

(ආ) හුලංදා ඔය පිරී ඉතිරී ගලන හඬින්

(ලකුණු 04×5=20යි)

3. (අ) උම්මග්ග ජාතක කතාකරුවා විසින් මහෞෂධ චරිතය විස්තර කරන සෑම අවස්ථාවක ම එම චරිතයේ තේජාන්විත පෞරුෂය, ප්‍රඥාව, නිර්භීතකම ආදි උසස් ගුණ නිරූපණය වන ආකාරයකට එය සිදු කරනු ලබයි. කතුවරයා විසින් මෙන් ම මහෞෂධ පඬිවරයාගේ සිතිවිලි මාර්ගයෙන් ද, කථාවේ වෙනත් චරිත මාර්ගයෙන් ද මහෞෂධ පණ්ඩිතයන් පිළිබඳ පවසන අදහස් කෙරෙහි මෙහි දී අවධානය යොමු කොට තිබිය යුතු ය.

- "ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නා ලද මිථිලා නම් රාජධානිය සිංහයකු විසින් රක්නා ලද රත් ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසි කෙනෙකුන් විසින් ගන්ට නොහැක්කී ය."
- ".... මේ රජ්ජුරුවනට මා මුත් අනෙක් පිළිසරණක් නැති. රජ්ජුරුවන් අස්වසාලම්'යි සිතා ඉක්බිති රජ්ජුරුවනට මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රග්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහ රාජයකු මෙන්" නො බව මැනව, ...... මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක්හු මෙන් ද දුන්නක් අල්ලාගෙන වඳුරු මුළක් පලවන එකක්හු පරිද්දෙන් ........"

- "මහෞෂධ පණ්ඩිතයෝ නම් මම ය. කිසි භයක් නො කරව; මාගේ අනුභාව බලව"
- මහ බෝසතාණන් වහන්සේ ද ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීර්‍ය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ...... කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ විජෘම්භනය කෙරෙමින් ........
- ජාතක කතාකරුවා බමුණු සමාජය බලවත් අවඥාවට ලක් කිරීම සඳහා ගන්නා උත්සාහය කේවට්ට චරිතය නිරූපණය කොට ඇති ආකාරයෙන් පැහැදිලි වෙයි. කේවට්ටගේ කපටි කෛරාටික ගති මෙන් ම නිවට, නියාලු, කැදර ගති ද උපයෝගි කර ගෙන උම්මග්ග ජාතක කතාකරුවා කේවට්ටගේ චරිතය අවඥාවට ලක් කරන අවස්ථා පහත දැක්වෙයි.
- ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දි, සාල්ලෙක ලා ලා පාතට බාන කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඬක් හෙළා, කිමෙක්දැ' යි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්චස් පිඬක් හෙළා ....... "
- මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ මා තව ම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන් හ'……"
- .. ඒ අසා "ආචාරීනි උපාය නම් ... කිම් ද? මේ සා මහත් වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවකුත් දුටු දැ නැති"
- "…. මා නො වඳුව'යි කිය කියා මුඛය හා සමග නළල පෙරළ පෙරළා කොරසැඩි බිම උලා රත් වද මලක් සේ ලේ හා පස් හා වකා"
- "කොල පවිටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල ..... "

(ලකුණු 15යි )

නැතහොත්

(ආ) * සැළලිහිණි සන්දේශ කතුවරයා අර්ථාලංකාර හා ශබ්දාලංකාර අපූර්ව වස්තු වර්ණනා කිරීමෙහි ලා ඉතා සාර්ථකව යොදා ගෙන ඇත.

අර්ථාලංකාර

- **මහ මුහුද දැක්වීමේ දී - උපමා රූපක යොදා ගැනීම**

උදා: වල දින අදහසින් මෙන් සුර ගඟ අඟන<br>
නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන

- **සමනොළ කන්ද - රූපක**

උදා: කැරපුද වඳින රැඳි මුනි සිරි පා තඹර

- **කයිකාවල - මුරපොළ**

උදා: අයි රාවණ වුවත් නවතන රිසින් එන<br>
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින<br>
වයි යාකරන් මල් තුරු ගන වන හිසින

- **සපුමල් කුමරු ජයග්‍රහණය**

උදා: බල සේනානායක සපු කුමරු එන

ශබ්දාලංකාර

- **එළිසමය අනුප්‍රාසය - ගුරු බැවුල ගම ඇසුරෙන්**

  උදා: රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී

- **එළිසමය - සුමුටාන ගම ඇසුරෙන් තරුණයන්ගේ ස්වරූපය**

  උදා: කස්තුරි තිලක සැදි නළලත සුමටාන

- මාත්‍රා 18කින් යුතු සමුද්‍රඝෝෂ විරිත යොදා තිබීම

  (බොහෝ පද්‍ය උදාහරණ ලෙස යොදා ගත හැකි වේ.)

4. මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියෙන් ජාතිකාභිමානී හැඟීම් ජනනය කිරීමත් අනාගත ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීමත් සිදු වේ.

**ජාතිකාභිමානි හැඟීම් ජනනය කිරීම**

උදා:
- ජාතිය රන් විමනක් වේ
- ජාතික රණ දෙරණ මතේ
- තමන් ලැබූ දිවි පෙවෙතේ
  කොටසක් රට සමය වෙතේ
- නිදහස මහ මුහුදක් වේ

**චරිත සංවර්ධනයට කෙරෙන මග පෙන්වීම**

උදා:
- ඉටු කොට කළ යුතු යුතුකම්
- කාටත් හිමි පොදු දේ නම්
- මිතුරු කමින් පෙරට එතොත්
- සිනිඳු මොළොක් බව මෙලෙහි
- කරදර දහසක් හමු වී
  ඉන්ටැකි නම් සිනා වෙවී

නැතහොත්

මෑත ඉතිහාසයේ පහළ වූ ශ්‍රේෂ්ඨ කවියෙකු ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර හැඳින්විය හැකි වුව ද ඔහු විසින් ලියා පළ කළ කාව්‍ය සංග්‍රහ කිසිවක් නැත. ඔහුගේ කවිත්වය ඉස්මතුව පෙනෙන්නේ ඔහු තැනූ නාට්‍යවලිනි. ඒ අතර සිංහබාහු නාට්‍යය සුවිශේෂී වෙයි. එහි උපයුක්ත භාෂාව කාව්‍ය ගුණයෙන් මෙන් ම ගීතවත් බවින් ද අනූන ය. සිංහයාගේ හා සිංහබාහුගේ සිතුම් පැතුම් නිරූපණය කරන අවස්ථාවන්හි නාට්‍යකරුවා යොදා ගෙන ඇති භාෂාව ගීතවත් බවින් යුක්ත ය.

- සිංහබාහු, සුප්පාදේවි හා සිංහ සීවලී ගල් ලෙනෙන් නික්ම ගොස් ඇති අන්දම දකින සිංහයා තුළ උපන් දැඩි ශෝකය නාට්‍යකරුවා ගීතවත් බසකින් ඔහු මුවට නංවන අපූරුව පහත ගීතවලින් පෙනී යයි.

- **සිංහබාහු සම්බන්ධ හැඟීම්**

  ගල්ලෙන බිඳලා
  ලෙන් දොර හැර ලා
  සිංහබා සිංහබා සිංහබා
  මා සොඳුර මා සොඳුර මා සොඳුර
  සිංහ සීවලී මා ප්‍රිය දියණිය

- **දියණිය ගැන ඇති හැඟීම**

  සුරතල් දියණිය

  මොළ කැටි වදනින්

  මා සනසන්නිය

  අහර පිසින්නිය

- **බිරිඳ ගැන ඇති හැඟීම**

  හෙනයක් සේ පතිත වූ අහසින්

  හිස මතට දෙදරුම් දී

  බමවා ම ඉඳුරන් ඇඳුරු කරමින්

  පහරිනා රුදුරු

සිංහබාහු යෞවනත්වයෙන් පරිපූර්ණ තරුණයෙකි. ඔහු දකින සිහිනය නව ලොවකි. ස්වාධීන ජීවිතයකි. එමෙන් ම ඔහුට පැවරී ඇති වගකීම් හා යුතුකම් ඉටුකිරීමට ඔහුට අවැසි ය. ඒ සඳහා ඇති බාධා බිඳ දමා ඉදිරියට යාමට ඔහු සැරසයි. ඔහුගේ ඒ සිතුම් පැතුම් ප්‍රකට කෙරන තැන්වල ඔහු මුවට නංවන වදන් ගීතවත් බවින් පිරී ඇත.

කිම් ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මේ අරුමා

සිංහබාහු තුළ ලියලා එන අසහනය කොතෙක් දැයි පහත සඳහන් ගීයේ "කුමක් දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ" යන කොටස පුනරුච්චාරණයෙන් ධ්වනිත කෙරෙයි.

- සිංහයෙක් වේ මා පියා
  ජන්මයෙන් ලත් මේ අරන්නේ
  පුරුදු වූ වාසෙ සදා ....
- ආත්මාභිමානයෙන් ඔද වැඩී ගිය යෞවන මදයෙන් මත් වූ තරුණයෙකුගේ ප්‍රකාශයක් සේ ඉදිරිපත් වන පහත ගායනයේ චිරන්තන සිංහල සාහිත්‍යයේ යෙදුම් ගීතවත්ව ගළපා ඇති අයුරු විමසන්න
  තුමුල ගතින් දා
  බාහු බෙලෙන් දා
  වෙමි සේ තිදසින් දා
  කුරිරු ගිජින්දා
  කුඹු තල සින්දා
  ලම් සේ කෙසරින් දා ...

5. කුරහන් වගාවේ ආරම්භයේ සිට අස්වනු නෙළා ගැනීම දක්වා වූ සමස්ත ක්‍රියාවලිය ම කුරහන් ඉසිමුව කළුවර බලලා කවි පෙළෙහි අන්තර්ගත වේ.

උදා:
- ආරම්භය - දුරුතු මහේ දි කැලයට වැදීලා
  මසක් පමණ කල් කැලෑවල් කොටාලා
- බිම් සකස් කිරීම - මැදින් දිනේ දී වල් ගිනි තබාලා
- වගාවේ මුල් අවස්ථාව - නිල්ල අඹති සත් දවසින් බැලුවා ම
- කිරි වැදෙන අවස්ථාව - ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති
- වගාව ආරක්ෂා කිරීම - ඇහැට වෙහෙස ඇත තුන්යමට නිදි නැති
  හේනේ පැලේ මා විදිනා සුරුක්කන්

  වැට අහුරා ඌරන්ගෙන් වළක්කන්
- පලදාව සරු වීම - මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්

  රන්වන් කරල් බරවී ඇති සුරක්කන්
- අස්වැන්න නෙළා ගැනීම - කපමු නෑනෙ ඉපනැල්ලේ සුබාවේ

6. මහගම සේකරගේ ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගෙන ඇති දෑතේ කරගැට සිඹ සනසන්නට පැදි පෙළින් ශ්‍රමය වගුරන ගොවි කම්කරු පිරිස් කෙරෙහි සහෘදයා තුළ ගෞරවයක් ජනිත කිරිමට කවියා උත්සාහ ගනියි. ගොවි බිමේ, වැඩ බිමේ කය වෙහෙසා වැඩකරන ශ්‍රමිකයාගේ මෙහෙවර දැයක් ගොඩනගන්නට ඉවහල් වෙයි. ඒ ශ්‍රමයට ගෞරවයෙන් කෘතවේදිත්වය පළ කළ යුතු ය. කවියා එම අදහස් ඉස්මතු කරන පහත සඳහන් අවස්ථා නිදසුන් ලෙස ඉදිරිපත් වී තිබිය යුතු ය.

ගොවියකුගේ ශ්‍රමය සතුටක් බවට පෙරළෙන්නේ භෝග සරුසාරව වැඩෙන සැටි දකින විට ය.

දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල බරින් පීදී වැගිරෙයි

රට ස්වයංපෝෂණය කළ මහ වැව් සෑදුණේ ද යෝධ මිනිස් ශ්‍රමයේ මහිමයෙනි.

දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ...

ශ්‍රමිකයාගේ වෙහෙසෙහි ප්‍රතිඵල හිමි වන්නේ අනාගත පරපුරට ය. එබැවින් ශ්‍රමය වගුරන්නා කෙරෙහි අප හදෙහි ගෞරවයක් ඇති විය යුතු ය. ශ්‍රමය වැගිරීම යනු උසස් ක්‍රියාවකි.

මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහි වන විට පුංචි පුතුන්

7. දියමන්ති මාලය කෙටිකතාවේ එන මැටිල්ඩාගේ ස්වාමි පුරුෂයා ලෙසින් ලොයිසල් මහතා යහපත් ස්වාමි පුරුෂයකු ලෙස තම වගකීම් හා යුතුකම් මහත් වූ සෙනෙහසකින් හා ඕනෑකමකින් ඉටු කරන තරුණ ස්වාමියෙකි. වෘත්තියෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු ලිපිකරුවෙකි.

බිරිඳගේ විවිධ ක්‍රියාකාරකම් හමුවේ ඉවසිලිවන්තව කටයුතු කරයි. බිරිඳ සතුටු කරයි.

- නිවෙසේ වැඩපළ කර දීමට මෙහෙකාර දැරියක් යෙදවීම තුළින්
- සුප් බඳුනෙහි වැහුම් අරිමින් ප්‍රබෝධයෙන් කරන ප්‍රකාශය පිළිබඳ තැකීමක් නොකරන බිරිඳ පිළිබඳ ව කෝප නොගැනීම
- බිරිඳ සතුටු කිරීමට ප්‍රිය සම්භාෂණය සඳහා රැගෙන ආ ආරාධනා පත්‍රය අවඥාවෙන් මේසය මතට විසි කර දමද්දී එම අවස්ථාවේ වටිනාකම පහදා දීම
- තමාගේ සතුට වෙනුවෙන් අමාරුවෙන් ඉතිරි කළ මුදල් බිරිඳගේ අවශ්‍යතා සඳහා වියදම් කිරීමට ඉදිරිපත් වීම.
- මැටිල්ඩා ආභරණ නොමැති වීම පිළිබඳ චෝදනා මුඛයෙන් කතා කරද්දී ඔහුට හැකි පමණින් යෝජනා ඉදිරිපත් කිරීම
- උත්සව අවස්ථාවේ දී තම බිරිඳට සතුටින් කාලය ගත කිරීමට ඉඩ හැර දිගු වේලාවක් හිස් පාළු කාමරයක ගත කිරීම
- මාලය නැති වීම පිළිබඳ ව චෝදනා නොකර ඉතා වෙහෙස මහන්සි වී මුදල් සොයා ගන්නේ තම අනාගතය ම අවිනිශ්චිත බවට පත් කරමින් වීම.
- තම සියලු අවශ්‍යතා කැප කරන නමුත් ඒ පිළිබඳව චෝදනා හෝ අඬදබර නොව සහයෝගය, ආදරය, කැප කිරීම වැනි ගුණාංග ඉස්මතු වන ලෙස නිරූපණය කෙරේ. (අදාළ උද්ධෘත යොදා ගනිමින් මෙම අදහස් සනාථ කර තිබීම අවශ්‍ය වේ.)